අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்லை, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 | +94112785818
info@moe.gov.lk | www.moe.gov.lk

මගේ යොමුව / எனது இல. / My Ref. } ED/02/29/18/10/01

ඔබේ යොමුව / உமது இல. / Your Ref. }

දිනය / திகதி / Date } 2023.05.24

චක්‍රලේඛ අංක : 25/2023

සියලු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්වරු

සියලු පළාත් අධ්‍යාපන ලේකම්වරුන්

සියලු පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්

සියලු කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්

සියලු කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් වෙත

<u>ගුරු උපදේශක සේවය සඳහා ගැලපුම් දීමනාවක් ලබාදීම</u>

අංක අමප/23/0003/607/002 – I හා 2023.03.27 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයෙන් 2022.01.02 දින සිට ක්‍රියාත්මක වන පරිදි ගුරු උපදේශක සේවය සඳහා පහත සඳහන් පරිදි ගැලපුම් දීමනාවක් ලබා දීම අනුමත කර ඇති අතර ඒ අනුව ගෙවීම් කටයුතු සිදු කරන මෙන් කාරුණිකව දන්වමි.

I. ගුරු උපදේශක සේවයට අන්තර්ග්‍රහණය වීමට ප්‍රථම ශ්‍රී ලංකා ගුරු සේවයේ ලබමින් සිටි වැටුප් වර්ධක අගයට වඩා ගුරු උපදේශක සේවයේදී හිමි වූ වැටුප් වර්ධකය අඩු වී ඇති ගුරු උපදේශකවරුන්ට පමණක් නව වැටුප් පරිමාණයේ අඩංගු වැටුප් වර්ධකයෙහි මූල්‍යමය අගය ශ්‍රී ලංකා ගුරු සේවයෙහි අවසන් වරට ලද වැටුප් වර්ධකයේ මූල්‍යමය අගයට වඩා අඩු වන කාල පරිච්ඡේදයට පමණක් සීමා වන සේ

   i. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006 හි 19 (ඉ) යටතේ දක්වා ඇති පරිදි ගැළපීමේ දීමනාවක් ලබා දීමටත්

   ii. එය සියලු කාර්යයන් සඳහා වැටුපෙහි කොටසක් ලෙස සැලකීමටත්

II. 2022.01.02 දිනට ගුරු උපදේශක සේවයට අන්තර්ග්‍රහණය වී ගුරු උපදේශක සේවයෙන් විශ්‍රාම ලබා ඇති ගුරු උපදේශක වරුන්ද මීට අදාළ වේ.

එම්.එන්. රණසිංහ

ලේකම්

අධ්‍යාපන අමාත්‍යාංශය

ගරු අමාත්‍යතුමා / கௌரவ அமைச்சர் / Hon. Minister
+94112784832 | +94112784825 | minister.education@moe.gov.lk

ලේකම් / செயலாளர் / Secretary
+94112784811 | +94112785162 | secretary.education@moe.gov.lk